**විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

**වෙත යොමු කරන ලද**

**පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත**

**සම්බන්ධයෙන්**

**විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව**

**පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ**

**විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා, පා.ම. විසිනි**

**2025 ජූනි මස 03 වැනි අඟහරුවාදා**

---

**விஞ்ஞானம்,  தொழில்நுட்பம் மற்றும் டிஜிட்டல் பரிணாமம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவிற்கு**

**ஆற்றுப்படுத்தப்பட்ட**

**தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தச்) சட்டமூலம்**

**மீதான**

**விஞ்ஞானம்,  தொழில்நுட்பம் மற்றும் டிஜிட்டல் பரிணாமம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின்**

**அறிக்கை**

**விஞ்ஞானம்,  தொழில்நுட்பம் மற்றும் டிஜிட்டல் பரிணாமம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின்**

**தவிசாளர்**

**கௌரவ (டாக்டர்) ஜனக சேனாரத்ன, பா.உ. அவர்களால்**

**பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது.**

**2025  யூன் 03, செவ்வாய்க்கிழமை**

---

**Report of the**

**Sectoral Oversight Committee on Science, Technology and Digital Transformation**

**on**

**Personal Data Protection (Amendment) Bill**

**referred to**

**Sectoral Oversight Committee on Science, Technology and Digital Transformation**

**Presented to Parliament by**

**Hon. (Dr.) Janaka Senarathna, M.P.**

**Chair of the**

**Sectoral Oversight Committee on Science, Technology and Digital Transformation**

**Tuesday, 03 June 2025**

## කාරක සභාවේ වාර්තාව

2025 මැයි මස 27 වන දින පාර්ලිමේන්තුවේදී රැස් වූ විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් පනත් කෙටුම්පත සලකා බලන ලදී.

- පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත
  (2025 මැයි මස 08 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලදුව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

**සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්:**

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා, පා.ම. (සභාපති)
ගරු චතුරංග අබේසිංහ මහතා, පා.ම.
ගරු ලසිත් භාෂණ ගමගේ මහතා, පා.ම.
ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය, පා.ම.
ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.

**කාරක සභාවේ ලේකම්**

චූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ(පරිපාලන)

**සහභාගී වූ නිලධාරීන්**

**දත්ත ආරක්ෂණ අධිකාරිය**

ආචාර්ය කනිෂ්ක කරුණාසේන මහතා, අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ)

**නීතිපති දෙපාර්තමේන්තුව**

අබිගේල් සූරියකුමාර් ජයකොඩි මෙය, රජයේ නීතිඥ

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

යූ.එම්. සපුකොටන මහත්මිය, සහකාර නීති කෙටුම්පත් සම්පාදක

**හැඳින්වීම**

2022 අංක 09 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ අරමුණ වන්නේ පෞද්ගලික දත්ත සැකසීම, නියාමනය කිරීම, පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් හඳුනා ගැනීම සහ ශක්තිමත් කිරීම, දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම හා ඊට සම්බන්ධ විධිවිධාන සැලසීමයි. 2025.05.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් ප්‍රධාන පනත ක්‍රියාත්මක කිරීමේදී අත්‍යවශ්‍ය යැයි සැලකෙන සංශෝධන, අනාගතයේදි දත්ත සම්බන්ධයෙන් ඇතිවන තත්ත්වයන්ට සූදානම්ව බලය ක්‍රියාත්මක කිරීමට ආයතනයක් තිබීමේ වැදගත්කම හඳුනා ගනිමින්, රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකටම ඩිජිටල් උපායමාර්ග අනුගමනය කිරීමට සමානව සහාය වීම සඳහා සහ දත්ත විෂයයන්ගේ අයිතිවාසිකම් අර්ථවත් ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා පුළුල් ලෙස උපකාරී වනු ඇත.

**කාරක සභා නිරීක්ෂණ**

1. 2022 පනත සම්මත වුවද, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ගැටළු හේතුවෙන් එය තවමත් පූර්ණව ක්‍රියාවට නැංවී නොමැති බවත් මෙම සංශෝධන මගින් එම බාධාවන් ඉවත් කිරීමට අපේක්ෂා කරන බව.
2. පනතේ ක්‍රියාත්මක වීමේ දිනය සම්බන්ධ ප්‍රතිපාදනය ඉවත් කර අමාත්‍යවරයාට පනත අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට දින නියම කිරීමට ඉඩ සලසා ඇති බව.
3. දත්ත ආරක්ෂණ අධිකාරිය (DPA) පිහිටුවා ඇතත්, ක්‍රියාත්මක වීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය (42 දෙනෙකු පමණ) බඳවා ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතින අතර ඒ සඳහා අවශ්‍ය නීති කෙටුම්පත් කර අවසන් බවත් එය නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බවත් මේ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ද ලබාගෙන ඇති බැවින් ඉදිරි මාස 3-4 තුළ කාර්ය මණ්ඩලය සපයා ගැනීමට හැකි වනු ඇති බව.
4. දත්ත ආරක්ෂණ අධිකාරියට මාර්ගෝපදේශ සැදීමට ඇති බලය පුළුල් කර ඇති බවත් දැනට දත්ත කළමණාකරන සැලසුම් සම්බන්ධයෙන් පමණක් මාර්ගෝපදේශ සෑදීමට බලය ඇති අතර සංශෝධනයෙන්

පසු පනතේ සඳහන් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සෑදීමට අධිකාරියට බලය ලැබෙන බව.

5. රාජ්‍ය සංස්ථාවක් විසින් දත්ත සැකසීම සිදු කරනු ලබන අවස්ථාවකදී දත්ත ආරක්ෂණ නිලධාරීයෙකු නම් කිරීමේ හෝ පත් කිරීමේ අවශ්‍යතාවය මෙම පනත මගින් බැහැර කර ඇත්තේ දත්ත ආරක්ෂණ නිලධාරවරයා පනතේ පාලකවරයා (Controller) සහ පොදු අධිකාරිය (Public Authority) යන නිර්වචන යටතට දැනටමත් ඇතුළත් බැවින් දේශසීමා හරහා දත්ත හුවමාරුවේදී පුද්ගලික අංශය (උදා: බැංකු) හා සමානව කටයුතු කිරීමට ඔවුන්ට ඉඩ සැලසෙන බැවින් වන බව.
6. පෞද්ගලික දත්ත බලපෑම් තක්සේරුවක් (DPIA) සිදුකළ හැක්කේ අධිකාරිය වෙත ලිඛිත ඉල්ලීමක් කළහොත් පමණක් වීම හඳුන්වා දීම මගින් අධිකාරියේ අනවශ්‍ය වැඩ සහ ප්‍රමාදයන් අවම කරන බව.
7. පොදු අධිකාරියක් වන පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින්, (5) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි පෞද්ගලික දත්ත ප්‍රභේද සම්බන්ධයෙන් දේශසීමා හරහා දත්ත සංචලනවල නිරත නොවිය යුතු බව.

**කාරක සභාවේ තීරණ**

සලකා බැලීමෙන් අනතුරුව, කාරක සභාව පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකඟ වූ අතර, ඒ පිළිබඳව සකසන ලද කාරක සභාවේ මෙම වාර්තාව කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා විසින් 2025 ජුනි මස 03 වැනි අඟහරුවාදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන ලදී.